## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 222

### සෞඛ්‍ය අමාත්‍යාංශය

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

## பாராளுமன்ற வெளியீட்டு தொடர் இல - 222

### சுகாதார அமைச்சு

பாராளுமன்ற அரச கணக்குகள் குழுவினால் முன் வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியல் கட்டளை இலக்கம் 119(4)இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

# Parliamentary Series Number – 222

## Ministry of Health

## Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 222
ආයතනයේ නම - සෞඛ්‍ය අමාත්‍යාංශය

| කාරක සභා නිරීක්ෂණය/නියෝගය/නිර්දේශය | නිර්දේශය/නියෝගය ක්‍රියාත්මක කිරිම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| නව ස්වස්ථ දත්ත පද්ධතිය සියළු රෝහල් වල සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන දින වකවානු ඇතුළත් වාර්තාවක් ලබා දීම | සෞඛ්‍ය ලේකම්ගේ අංක CA/AQ/FCC 02/COPA/2019-2021/MOH/2023(IV) හා 2023.10.06 දිනැතිව මේ සම්බන්ධයෙන් වන වාර්තාව ඉදිරිපත් කර ඇත.<br><br>2025.07.31 දින වන විට ස්වස්ථ දත්ත පද්ධතිය රෝහල් 2742 ක් දක්වා ව්‍යාප්ත කර දිවයිනේ පවතින සියලු රෝහල් ආවරණය කිරීමට කටයුතු කර ඇත. |
| ඖෂධ හදිසි මිලදී ගැනීමේදී ඖෂධ තිබියදීත් වැඩි මිලකට හදිසි මිලදී ගැනීම් සිදු කිරීම | ඖෂධ මිලදී ගැනීමේදී ආනයනික ඖෂධ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා ප්‍රසම්පාදනයෙන් ලබාගනු ලබන අතර අනෙකුත් ඖෂධ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා දේශීය නිෂ්පාදකයින්ගෙන් ලබා ගැනීම සිදු කරයි. මේ සඳහා අදාළ ඇණවුම් නියමිත කාල රාමුව තුල ලබා දීම සඳහා එම ඇණවුම් වල ප්‍රගතිය වෛද්‍ය සැපයුම් සමාලෝචන රැස්වීමේදී අධීක්ෂණය කිරීම ද සිදු කරනු ලබයි.<br><br>එමනිසා හදිසි මිලදී ගැනීම් සිදු කිරීම මේ වන විට අවම කර ඇති අතර රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා අත්‍යවශ්‍යම අවස්ථාවකදී පමණක් එවැනි මිලදී ගැනීමක් නියමිත අනුමැතියන්ට යටත්ව සිදු කිරීම කරනු ලබයි. එනම් සතිපතා පවත්වනු ලබන ඖෂධ සමාලෝචන රැස්වීම් මඟින් සැපයීම් පිළිබඳව සමාලෝචනයක් සිදුකර ඉතාම අත්‍යාවශ්‍ය අවස්ථාවදී පමණක් එවැනි හදිසි මිලදී ගැනීම් තීරණ වලට එළඹෙන අතර ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ගනු ලබන සාමූහික තීරණයක් මත පමණක් එය සිදු කරනු ලබයි.<br><br>මෙහිදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා සිදු කරන සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියට මේ වන විට ප්‍රමුඛත්වය ලබා දී එය දිරිගන්වා ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට උපදෙස් ලබා දී ඇත. තවද මේ වන විට ආනයනික ඖෂධ ලබා ගැනීමේදී අවම මාස 06ක තොගයක් එක් එක් අයිතමය ලබා ගැනීමට ඇණවුම් කාලසටහන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ලබා දී ඇති අතර ඒ අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ණයවර ලිපි නිකුත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |

තවද මේ වනවිට ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති 2026 ඇණවුම් වල තොග මේ වසරේ නොවැම්බර් මස සිට වෛද්‍ය සැපයීම් අංශයට ලබා ගැනීම සඳහා අවශ්‍ය වැඩකටයුතු මේ වන විට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මඟින් සිදු කරමින් පවතී.

මීට අමතරව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා දේශීය නිෂ්පාදකයින් හරහා ද තවත් ඖෂධ ලබා ගැනීමට දිරි ගන්වා ඇති අතර එමගින් ආනයනික ඖෂධ ප්‍රමාණය අඩුකර ගැනීමට හා ගුණාත්මකභාවයෙන් යුතු උසස් ඖෂධ දේශීයව නිපදවා ගැනීමට දේශීය සැපයුම්කරුවන්ට උපරිම සහයෝගය ලබා දී ඇත.

තවද වෛද්‍ය සැපයීම් අංශයේ ප්‍රමාණවත් තොග පවත්වාගෙන යාම සඳහා ගබඩා පහසුකම් පුළුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. ඒ සඳහා ආසියානු සංවර්ධන බැංකුව (ADB) හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) ආධාර මත නව ගබඩා ඉදිකිරීම සඳහාත්, පවතින ගබඩා වැඩිදියුණු කිරීම සඳහාත් අවශ්‍ය ප්‍රතිපාදන වෙන්ව ඇති අතර එම කටයුතු හැකි ඉක්මණින් අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඒ අනුව ඖෂධවල ගුණාත්මකභාවය ද ආරක්ෂා වන පරිදි ප්‍රමාණවත් තොග පවත්වාගෙන යාමෙන් හදිසි මිලදී ගැනීම් අවම කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලක් මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී.

කෙසේ වුවද ලියාපදිංචි සැපයුම්කරුවන් නොමැති වීම හෝ වෙනත් ප්‍රසම්පාදන ගැටළු හේතුවෙන් සැපයීමට නොහැකි ඖෂධ ලබා ගැනීම සඳහා වෙනත් විකල්ප ක්‍රියාමාර්ග මේ වන විට යෝජනා කර ඇති අතර එම යෝජනා කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කරමින් මූලික අඩිතාලම සකසා ඖෂධ හිඟය අවම කර හදිසි මිලදී ගැනීම් වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

ඉහත සියලු කරනා සිදු වුවද / සිදු කරමින් පැවතියද නොවැළැක්විය හැකි හේතූන් මත රෝගී සත්කාර සේවා පවත්වා ගෙන යාමේදී ආයතනවල ඇතිවන ඖෂධ හිඟයන් මඟහරවා ගැනීම සඳහා ප්‍රාදේශීය මිලදී ගැනීම් සිදු කිරීමට සිදුවන අතර ඒ සඳහා අවසර ලබාදීම ප්‍රසම්පාදන පිළිබඳ මාර්ගෝපදේශ වලට අනුගත වෙමින් සිදු කරනු ලැබේ. එහිදී කුඩා පරිමාණයෙන් මිලදී ගැනීම නිසා ටෙන්ඩර් මිලට වඩා මිල උච්චාවචනයන් සිදු වුවද, විකල්ප ක්‍රියාමාර්ගයන් නොමැති නිසාත්, රෝගී සත්කාර සේවා අඛණ්ඩව සිදුකිරීම සඳහාත් එම ක්‍රමවේදය අනුගමනය කිරීමට සිදුව තිබේ.

| | |
|---|---|
| සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ ස්ථාපිත කර තිබූ Medical Supply Management Information System (MSMIS) පද්ධතිය හා ස්වස්ථ පද්ධතිය MSMIS පද්ධතිය ක්‍රියාත්මක කළ හැකි බවට පිටු 77 කින් යුත් වාර්තාවක් කොළඹ විශ්ව විද්‍යාලය මඟින් ඉදිරිපත් කර තිබියදී නව පද්ධතියක් හඳුන්වා දෙන ලෙස එකී වාර්තාවට අලුතින් එක් කළ "78 පිටුව" මඟින් යෝජනා කර තිබීම පිළිබඳව පරීක්ෂා කර බලා වාර්තාවක් ඉදිරිපත් කිරීම | සෞඛ්‍ය ලේකම්ගේ අංක CA/AQ/FCC 02/COPA/2019-2021/MOH/2023(IV) හා 2023.10.06 දිනැතිව මේ සම්බන්ධයෙන් වන වාර්තාව ඉදිරිපත් කර ඇත. |
| විනයානුකූලව කටයුතු කිරීම - කොළඹ ජාතික රෝහලේ බාහිර රෝගී අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස සේවය කල නිලධාරිනිය සම්බන්ධයෙන් පැවති සියලු චෝදනා වලින් නිදහස් කර ඇති බව කාරක සභාව හමුවේ අනාවරණය වීම හේතුවෙන් මෙම සිදුවීම සම්බන්ධ පූර්ණ වාර්තාවක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ලබා ගැනීම. | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලද නිර්දේශයකි. |
| <u>ජාතික පිළිකා මර්ධන වැඩසටහන</u> රෝගීන් සඳහා ඉහළ ගුණාත්මකභාවයකින් යුත් අධිශක්ති විකිරණ උපකරණ ස්ථාපිත කිරීම | **<u>1)පිළිකා රෝගය නිසා සිදුවන මරණ සංඛ්‍යාව වර්ධනය වීම</u>**<br><br>පිළිකා රෝගය නිසා ඇතිවන මරණ සංඛ්‍යාව අඩුකිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පියවර ගණනාවක් ගෙන ඇත.<br><br>I.පිළිකා කලින් හඳුනා ගැනීමේ ක්‍රමෝපායයන් තව දුරටත් ශක්තිමත් කිරීම.<br><br>බිම්මට්ටම දක්වා සේවා සපයන සුවනාරි සායන වැඩසටහන් ( සායන දහසකට වැඩි ) සහ සුවදිවි මධ්‍යස්ථාන ( Healthy Life style centre ) (මධ්‍යස්ථාන දහසකට වැඩි) මඟින් පිළිකා කලින් හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් ශක්තිමත් කර ඇත. තවද පිළිකා කලින් හඳුනා ගැනීමේ සායන ස්ථාපිත කොට ඒ හරහා ද පිළිකා කලින් හඳුනා ගැනීම සහ අවශ්‍ය උපදෙස් ලබා දීමද සිදු කරනු ලැබේ. මේ වන විට පිළිකා කලින් හඳුනා ගැනීමේ මධ්‍යස්ථාන ( Cancer Early Detection Centres ) 5ක් දිවයින පුරා පිහිටුවා ඇත.<br><br>දන්ත ශල්‍ය වෛද්‍ය සායන හරහා මුඛ පිළිකාව පූර්ව පිළිකා අවධියේදී හඳුනාගැනීමේ අවස්ථාව ශක්තිමත් කර ඇත. එමෙන්ම අධි අවදානම් සහිත කණ්ඩායම් සඳහා ජංගම දන්ත සායන මඟින්ද පිළිකා සහ පූර්ව මුඛ පිළිකා හඳුනාගැනීමේ ජාතික වැඩ පිළිවෙලක්ද පවත්වා ගෙන යනු ලැබේ. |

මෙයට අමතරව, ශල්‍ය වෛද්‍යවරුන් ( General Surgeon ) සහ පිළිකා පිළිබඳ ශල්‍ය වෛද්‍යවරුන් ( Onco surgeon ) ගේ නායකත්වය යටතේ පියයුරු සායන ( Breast Clinic ) 26ක් දිවයිනේ පළාත් 9 පුරාම විසිරී ක්‍රියාත්මක වෙයි.

තව දුරටත් පිළිකා සඳහා ලබා දෙන ප්‍රතිකාර විධිමත් කිරීම සහ ගුණාත්මක වැඩි දියුණු කිරීම සඳහා වැඩපිළිවෙලවල් සකස් කොට ඇත .

උදා:

II. පිළිකා රෝග නිශ්චය කිරීම සඳහාවන පහසුකම් වැඩි දියුණු කිරීම.

III. පිළිකා ප්‍රතිකාර ඒකක සහ ලබා දුන් Linear accelerator ප්‍රතිකාර ශක්තිමත් කිරීම.

**2)** <u>දුම්කොළ සහ දුම්වැටි ආශ්‍රිත පිළිකා මර්දන සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග</u>

i. දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය ශක්තිමත් යාන්ත්‍රණයක් බවට පත් කිරීම. ඒ යටතේ පහත ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇත.

- 1948 හදිසි ඇමතුම් අංකය යටතේ ලබා දෙන මනෝ උපදේශන සේවාව වැඩිදියුණු කිරීම මඟින් දුම්කොළ හා මධ්‍යසාර භාවිත කරන පිරිස එයින් මුදවා ගැනීමට අවශ්‍ය මනෝ උපදේශන සේවා ලබා දීම.
- දුම්කොළ නිශ්පාදනය සඳහා ශ්‍රී ලංකාවේ පවත්නා බදුකරණ ව්‍යුහය වෙනස් කර සංවර්ධිත බදුකරණ මොඩියුලයක් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පැවතීම. මෙමඟින් මිලදී ගැනීමේ හැකියාව අවම කිරීම හා නවකයින් දුම්වැටි මිලදී ගැනීමට යොමුවීම අවම කිරීම හරහා දුම්කොළ භාවිතය අඩු කිරීම.
- නවකයින් දුම්කොළ භාවිතයට යොමුවීම අවම කිරීමට රූපමය අවවාද කාලානුරූපව වෙනස් කිරීම.

ii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින් රාජ්‍ය ආයතන දුම්කොළ භාවිතය අවම කිරීම.

iii. අවදානම් සාධකවලට නිරාවරණය වීම අවම කිරීම සඳහා පාසල් දරුවන් හරහා ප්‍රජාව දැනුවත් කිරීම සහ මුඛ පිළිකා කල්තියා හඳුනා ගැනීමේ වැදගත්කම පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා මුඛ පිළිකා වැළැක්වීම සහ පාලනය පිළිබඳ චිත්‍ර තරඟයක් පවත්වන ලදී.

iv. ශ්‍රී ලංකාවේ ලෝක හිස සහ ගෙල පිළිකා දිනය සැමරීම සඳහා මාධ්‍ය හමුවක් පැවැත්විණි. මාධ්‍ය හමුව අතරතුර මාධ්‍යවේදීන් අතර අදාළ අධ්‍යාපනික ද්‍රව්‍ය බෙදා හරින ලද අතර, ඒවා සාමාන්‍ය ජනතාව අතර පණිවිඩය බෙදා හැරීම සඳහා යොමුවක් ලෙස භාවිතා කළ හැකිය.

v. ශ්‍රී ලංකාවේ සිදු කරන ලද මුඛ පිළිකා පාලන ක්‍රියාකාරකම් ඇගයීම සඳහා මුඛ පිළිකා වැළැක්වීම සහ පාලනය පිළිබඳ ජාතික සමාලෝචනයක් පසුගිය වසරේදී ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් 27 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

vi. රාජ්‍ය ආයතන පරිශ්‍රයන් තුළ බුලත්, දුම්කොළ සහ පුවක් ආශ්‍රිත නිෂ්පාදන භාවිතය සහ විකිණීම තහනම් කිරීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා, සිංහල භාෂාවෙන් පෝස්ටර් 8,000ක් සහ දෙමළ භාෂාවෙන් 2,000ක් මුද්‍රණය කොට බෙදා හරින ලදී (2025 වසර සඳහා පමණක්) මහජනතාවගෙන් බහුතරයක් සේවා ලබා ගැනීම සඳහා ග්‍රාම නිලධාරී කාර්යාල වෙත පැමිණෙන බැවින්, ඔවුන්ගේ කාර්යාලවල ප්‍රදර්ශනය කිරීම සඳහා මෙම ආයතන අතර පෝස්ටර් බෙදා හරින ලදී.

vii. ආහාර පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් වන පුවක් සහ පුවක් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් මඟින් සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල දැනුවත් කොට ඇත.

### 3) Linear accelerator ක්‍රියාත්මක වීම

2025 වසරේදී ප්‍රධාන පිළිකා ප්‍රතිකාර පද්ධතියට නුවර පිළිකා රෝග ප්‍රතිකාර ඒකකයට ලබාදුන් Linear accelerator ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය වායු සමීකරණ පහසුකම් ලබාදී ඇත.

වෛද්‍ය නලින්ද ජයතිස්ස
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය

වෛද්‍ය නලින්ද ජයතිස්ස (පා.ම.)
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය
ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.